# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2074/28 – 2018 ජුනි 06 වැනි බදාදා – 2018.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: C.I/1832.

### කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය

එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 08, ගෝතමී පාර, පස්වන මහල, අංක 10 හි පිහිටා ඇති රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම සහ අනෙක් පාර්ශ්වය වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 හි පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සංගමය අතර 2017 ජුනි මස 01 වන දින ඇතිකරගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වන වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 මැයි මස 04 වැනි දින,
කොළඹ 05, කම්කරු දෙපාර්තමේන්තුව.

2017 අංක 27 දරන සාමූහික ගිවිසුම

**රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම - සාමූහික ගිවිසුම**

2017 ජුනි මස 01 - 2019 මැයි මස 31

කාර්මික ආරාවුල් පනතේ වගන්ති ප්‍රකාරව 2017 ජුනි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම සාමූහික ගිවිසුම සමාගමක් ලෙස 1982 අංක 07 දරන සමාගම් ආඥා පනත යටතේ නියමිත පරිදි ස්ථාපිත කර ඇති සහ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ

1A – G 27823 – 11 (2018/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නියමිත පරිදි නැවත ලියාපදිංචි වී ඇති සිය ලියාපදිංචි කාර්යාලය අංක 10 පස්වන මහල, ගෝතමී පාර, කොළඹ 08 යන ලිපිනයෙහි පිහිටි රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම එක් පාර්ශ්වයකුත් (මින් පසු සේවායෝජක වශයෙන් හඳුන්වනු ලබන) හා වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි වී ඇති සිය ලියාපදිංචි කාර්යාලය තලංගම කොස්වත්ත සෙත්සිරි මාවතේ අංක 259/9 යන ස්ථානයේ පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය (මින් පසු සමිතිය වශයෙන් හඳුන්වනු ලබන) අනෙකුත් පාර්ශ්වයන් වශයෙන් එම පාර්ශ්වයන් අතර, වර්ෂ 2017 ජුනි මස 01 වන දින ගිවිස ගන්නා ලදී.

2017 ජුනි මස 01 දිනෙන් ආරම්භ වන ඉදිරි දෙවර්ෂය සඳහා පාර්ශවයන් විසින් එකඟතාවයට පැමිණි කරුණු පහත පරිදි වේ.

මෙම සාමූහික ගිවිසුම ''**රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම - සාමූහික ගිවිසුම**'' වශයෙන් හඳුන්වනු ලැබේ.

01. ***ආවරණය වන හා බැඳෙන සේවකයින්.–*** විධායක ශ්‍රේණිවල හැර මෙම ගිවිසුම අත්සන් කරන දිනට සේවා යෝජකයාගේ සේවා නියුක්තියේ යෙදී සිටින සියළුම ස්ථිර සේවකයින් මෙම ගිවිසුමෙන් ආවරණය වී බැඳී සිටි.

02. ***ක්‍රියාත්මක වන දිනය සහ කාල සීමාව.–*** මෙම ගිවිසුම 2017 ජුනි මස 01 වන දින සිට බලපැවැත්වෙන අතර, එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවයට මාස 06 ක ලිඛිත පූර්ව දැන්වීමක් ලබාදීමෙන් අනතුරුව අවසන් කරන තෙක් එය ක්‍රියාත්මක විය යුතු අතර, යම් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත 2019 මැයි මස 31 වන දිනට පෙර එසේ දැනුම්දීමක් නොදිය යුතු වන අතර, එවැනි දැනුම්දීමක් කිසිසේත් වලංගු නොවන අතර මෙම ගිවිසුම 2019 මැයි මස 31 වන තෙක් අවසන් නොවනු ඇත. 2019 මැයි මස 31 වන දිනට පෙර නිකුත් කරනු ලබන වෙනත් කිසිදු පූර්ව දැන්වීමක් කිසිසේත් බලනොපැවැත්වෙනු ඇත. තවද යම් හේතුවකින් එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවයට මාස 06 කට ප්‍රථම දැනුම් දී, ගිවිසුම අවසන් කිරීමකට ලක් නොවන අවස්ථාවලදී නැවත නව ගිවිසුමක් අත්සන් කරන තෙක් මෙම ගිවිසුම වලංගු වනු ඇත.

03. *වැටුප් වැඩිවීම.–*

*(අ)* රු. 2000/-ක වැටුප් වැඩිවීමක්
2017 ජුනි මස වැටුපට රු. 1000/- ක් වන ලෙසත් දෙවන වසරේ ජුනි මස වැටුපට රු. 1000/- ක් වන ලෙසත් ගෙවීම.

*(ආ)* සේවා කාලය මත වැඩිවීම

| | | |
|---|---|---|
| * වසර 1 සිට 5 දක්වා | - | වසරකට රු. 75/- ක් වැඩිවීම |
| * වසර 6 සිට 10 දක්වා | - | වසරකට රු. 90/- ක් වැඩිවීම |
| * වසර 11 සිට 20 දක්වා | - | වසරකට රු. 125/- ක් වැඩිවීම |

*(ආ)* 2018 ජුනි මස 01 වැනි දිනට ස්ථිර පත්වීම ලබා වැටුප් වර්ධක නොලද සේවකයින් සඳහා රු. 1000/- ක් වැඩිවීම.

04. වර්ෂයක් තුළදී තමන්ට හිමි නිවාඩු දින 07 ක් හෝ 7 ට අඩුවෙන් නිවාඩු ලබාගන්නා සේවක මහත්ම මහත්මීන්ට පමණක් දැනට ප්‍රසාද දීමනාවක් වශයෙන් ගෙවනු ලබන මාසික මූලික වැටුපට සමාන මුදලක් ඊළඟ වර්ෂයේ ජනවාරි මස ගෙවීමට කටයුතු කරනු ලැබේ.

05. ***ප්‍රසාද දීමනා ගෙවීම.–*** කළමනාකාරිත්වය තීරණය කරන පරිදි සියලුම සේවකයින් සඳහා ප්‍රසාද දීමනාවක් ලෙස රු. 6000/- කට නොඅඩු මුදලක් ගෙවනු ඇත. එම මුදල ලාභාංශ මත වැඩිකිරීම් සිදුවිය හැක.

06. මීට අමතරව වෙනත් කිසිදු ආකාරයක මූල්‍යමය වැඩිවීමක් මෙම ගිවිසුමේ කාලසීමාව තුළ සිදු නොවන බවට පාර්ශවයන් එකඟ වේ.

07. මෙම ගිවිසුම ක්‍රියාත්මක වන කාලය තුළදී මෙහි අන්තර්ගතවන කිසිම කරුණක් වෙනස් කිරීමට කිසිදු පාර්ශවයක් විසින් උත්සාහ නොකළ යුතු ය.

08. ආයතනයේ නිෂ්පාදනය ඉහල දැමීමට වෘත්තීය සමිතිය සහ කළමනාකාරිත්වය සහයෝගයෙන් කටයුතු කිරීමටත් වෘත්තීය සමිතිය හා එහි සාමාජිකයින් ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග හා වැඩසටහන්වලට පූර්ණ සහයෝගය දැක්වීමටත් එකඟ වේ.

09. ***ආරවුල් විසඳීමේ ක්‍රමවේදය.–*** ආයතනය තුළ කිනම් ආකාරයක හෝ ආරවුලක් මතුවූ අවස්ථාවකදී පහත සඳහන් ආරවුල් විසඳීමේ ක්‍රමවේදය අනුව කටයුතු කිරීමට දෙපාර්ශවය බැඳී සිටී.

*(අ)* ආරවුලක් සම්බන්ධයෙන් වූ කාරණාවකදී එම කාරණාව සම්බන්ධව සමථයකට එළඹීම සඳහා පළමුව ආයතනික මට්ටමින් පාලනාධිකාරිය හා වෘත්තීය සමිති නියෝජිතයින් අතර සාකච්ඡා කළ යුතු ය.

*(ආ)* එසේ ආරවුල සමථයකට පත්කිරීමට නොහැකි වූයේ නම්, ආරවුල සම්බන්ධයෙන් විසඳුමකට පැමිණීම සඳහා ශ්‍රී ලංකා සේව්‍ය සංගමය සමග සාකච්ඡාවක් වෙත යා යුතු යි.

*(ඇ)* එසේ ආරවුල සමථයකට පත් නොවන්නේ නම් අදාල කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කර සමථ කරන පිළිවෙත් අනුගමනය කළ යුතු වේ.

*(ඈ)* යම් ආරවුලක් ඇති වූ අවස්ථාවන්හිදී ඉහත ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමට වෘත්තීය සමිති එකඟ වන අතර, ආරවුල සමථයකට පත් නොවූ අවස්ථාවක දී දින (14) පැහැදිළි දැනුම් දීමකින් අනතුරුව වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට යොමුවීමට වෘත්තීය සමිතිවලට ඉඩකඩ ඇත.

සේවායෝජක පාර්ශවය වෙනුවෙන්,
රෝයල් ෆර්න්වුඩ් පෝසිලේන් සමාගම.

..............................
Yoshan Fernando
Chief Operating Officer
Royal Fernwood Porcelain Ltd.,
Police Station Road,
Kosgama.
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී.

සාක්ෂිකරු

..............................
ගයාන් බී. යාලේගම
පරිපාලන කළමණාකරු

වෘත්තීය සමිති පාර්ශවය වෙනුවෙන්,
අන්තර් සමාගම් සේවක සංගමය.

..............................
ඩබ්. ඒ. සෝමදාස
ජ්‍යෙෂ්ඨ උප සභාපති.

සාක්ෂිකරු

..............................
පී.කේ.පියල් දේශප්‍රිය
සභාපති

3

..............................
සභාපති
අන්තර් සමාගම් සේවක සංගමය
ෆර්න්වුඩ් ශාඛාව
කොස්ගම.

06 - 814

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.